- - -

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,109- 2019 පෙබරවාරි මස 01 වැනි සිකුරාදා - 2019.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 284 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 පෙබරවාරි මස 22 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 පෙබරවාරි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

283 - B 81492— 5,403 (2019/02)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) 1 වන ශ්‍රේණියේ නිලධාරීන් සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල සේවයේ නියුතු බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) 1 වන ශ්‍රේණියේ නිලධාරීන් සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියේ 2014 වර්ෂයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගෙන් (විශ්‍රාමික නිලධාරීන් ද ඇතුළුව) සේවා පළපුරුද්ද සහ කුසලතාවය මත පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

i. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සිවිල් 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හයම (06) උපයාගෙන තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදයක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම. (බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2013.06.01 දිනට සිවිල් 1 ශ්‍රේණියට උසස් වී වසර (05) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.)

03. අයදුම්පත් මෙම නිවේදනයේ අවසානයේ දක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයා විසින්ම නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කල යුතු ය.

04. සෑම අයදුම්පත්‍රයක්ම ඔබගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් (විශ්‍රාමික නිලධාරීන් සිය අවසන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින්) 2019.02.25 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ. ප.) අංක 109, මහ වීදිය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලේ එවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවීමේ නිවේනයට අදාළ කරුණු හෝ එම නිවේදනයේ ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

06. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ ද පළකර ඇත.

එම්. ජී. ඒ. තිලකරත්න,<br>
ලේකම්,<br>
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව *(බ.ප.).*

2019 ජනවාරි මස 16 වැනි දින.

*ආදර්ශ අයදුම්පත්‍රය*

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම (සේවා පළපුරුද්ද සහ කුසලතාවය මත)

*(නිලධාරියා විසින් සම්පූර්ණ කිරීම සඳහා)*

01. නම (මුලකුරු සමග) :..........................................................................................................................

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :...........................................................................................................

03. දැනට සේවය කරන දෙපාර්තමේන්තුව, සේවා ස්ථානය හා එහි ලිපිනය :............................................................

..........................................................................................................................................................

04. සේවය ස්ථිර කළ දිනය :..........................................................................................

05. බස්නාහිර පළාත් රාජ්‍ය තාක්ෂණ සේවයේ මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරි සේවයේ II අ/තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියට පත් වූ දිනය :..........................................................................................................................................

06. නව තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2013.06.01දිනට සිවිල් I වන ශ්‍රේණියේ සේවා කාලය :...............................

07. ම. ම. කා. නි. II අ/තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ සේවා කාලය තුළ කිසියම් විනය දඬුවමක් ලබා තිබේද? විනය පරීක්ෂණයකට ලක්කර හෝ එසේ කිරීමට නියමිතව තිබේද? :..........................................................................................
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. :..........................................................................................................................

08. ම.ම.කා. නි. II අ/තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා තිබේද? :.........................
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. :..........................................................................................................................

09. ම.ම.කා.නි. II අ/තාක්ෂණසේවයේ I වන ශ්‍රේණියේ කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබේද? :............................
එසේ නොවේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. :..................................................................................................................

මා විසින් ඉහතින් සඳහන් කර ඇති සියලුම තොරතුරු සාවද්‍ය යැයි තහවුරු වුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පිළිබඳ වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට ද හැකි බව මම හොඳාකාරව දනිමි.

..........................................,
නිලධාරියාගේ අත්සන.

දිනය :..................................

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

01. මෙම ආයතනයේ සේවයේ නියුතු බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, තාක්ෂණ සේවයේ (සිවිල්) ............................................ ....................... මයා/මිය විසින් සපයා ඇති තොරතුරු ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව සමග සසඳා බලන ලද බවත්, එම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මා පෞද්ගලිකව සෑහීමකට පත් වන බවත්,

02. මෙම නිලධාරියා/නිලධාරිණිය 2014.12.31 දිනට පූර්වාසන්න වසර 06 තුළ විනය විරෝධී කටයුත්තක් සම්බන්ධයෙන් විනයානුකූල කටයුතු සිදු කළ බවත්/නොකළ බවත් සිදු කිරීමට අදහස් කරන බවත්/නොකරන බවත්,

03. මෙම නිලධාරියා/නිලධාරිනියගේ 2014.12.31 දිනට පූර්වාසන්න වසර 06 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බව,

04. මෙම නිලධාරියා/නිලධාරිනියගේ 2014.12.31 දිනට පූර්වාසන්න වසර 06 තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇති/නැති බව,

- *සටහන.-* වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම්, වැටුප් වර්ධක උපයාගෙන නොමැති නම්, විනය විරෝධී කටයුත්තක් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර ඇත්නම් හෝ විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කරන්නේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න. :..........................................................................................................................................
..........................................................................................................................................................................

05. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) 06 උපලේඛනයට අනුව මෙම නිලධාරියාගේ 2014.12.31 දිනට පූර්වාසන්න වසර 05 තුළ කාර්යය සාධක වාර්තා ඇසුරින් මෙය සම්පූර්ණ කරන්න.

| *වර්ෂය* | *කාර්ය සාධනය* (ඉතා හොඳයි/හොඳයි) |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |

06. සිවිල් ක්ෂේත්‍රයට අදාලව ඩිප්ලෝමා සහතික (මාස 06 ක් හෝ ඊට වැඩි සහතික) (සනාථ කිරීම සඳහා සහතික කරන ලද ලේඛනවල පිටපත් අමුණා එවිය යුතුය.)

07. තොරතුරු තාක්ෂණ පාඨමාලා/පරිගණක පාඨමාලා සහතික (සනාථ කිරීම සඳහා සහතික කරන ලද ලේඛනවල පිටපත් අමුණා එවිය යුතුය.)

08. ව්‍යාපෘතියක්/ව්‍යාපෘති සාර්ථකව ඉටු කර ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ආයතන ප්‍රධානියාගේ අනුමැතිය සහිත වාර්ථාමය ඉදිරිපත් කිරීමක් (ඉටු කිරීමේ දී පැවති ගැටළු ඒවාට ලබාදුන් විසඳුම් ඇතුළත් විය යුතුය.)

09. සිවිල් ඉදිකිරීම් හා නඩත්තු සේවා කටයුතු ඉටු කිරීමේදී දක්වන සක්‍රීය දායකත්වය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ආයතන ප්‍රධානියාගේ සහතිකය.

10. මෙම නිලධාරියා/නිලධාරිණිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) බඳවා ගැනීමේ පරිපාටියට අනුව සියලු සුදුසුකම් සපුරා ඇති/නැති බව නිර්දේශ කරමි.

..............................................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය :..................................

*අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය*

ඉහත නිර්දේශය සමග එකඟ වෙමි./නොවෙමි.

...........................................................,
අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

දිනය :..................................

02-214

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | *රු.* | *ශ.* |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට | ... | ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | ... | ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2019 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **පෙබරවාරි** | 2019.02.01 | සිකුරාදා | 2019.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.08 | සිකුරාදා | 2019.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.15 | සිකුරාදා | 2019.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.22 | සිකුරාදා | 2019.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2019.03.01 | සිකුරාදා | 2019.02.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.08 | සිකුරාදා | 2019.02.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.15 | සිකුරාදා | 2019.03.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.22 | සිකුරාදා | 2019.03.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.29 | සිකුරාදා | 2019.03.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2019.04.05 | සිකුරාදා | 2019.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.12 | සිකුරාදා | 2019.03.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.18 | බ්‍රහස්පතින්දා | 2019.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.26 | සිකුරාදා | 2019.04.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.